**ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්ව විද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්ව විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමවිශ්ව විද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කිසියම් දේපලක සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකිවිට එහි ප්‍රත්‍යාගණිත අගයට ධාරණය කළයුතු වුවද විශ්ව විද්‍යාලය වෙත 1980 වර්ෂයේදී පවරා තිබුණු අක්කර 48 ක භූමිය, එම වත්කම හඳුනාගත් අවස්ථාවේ පැවති රු. 73,653,874 ක පිරිවැය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින් එම වත්කමෙහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය නොවුණි. | විශ්ව විද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව පිරිවැය ආකෘතිය අනුව දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා ගිණුම්ගත කිරීම සිදුකෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව දේපලෙහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය කළයුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහලේ පැවති රසායනික ද්‍රව්‍ය, ප්‍රතික්‍රියාකාරක, ශල්‍ය උපකරණ, විකිරණ ජායා පිටපත් හා වෛද්‍ය වායු (Medical Gas) යන තොග ශේෂයන්ගේ ද්විගණනය වීමක් හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට පැවැති වෛද්‍ය සැපයීම් තොගය රු. 44,228,143 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ අනුව ආදායම් ප්‍රකාශයේ දැක්වෙන වෙනත් ආදායම් හා රෝහල් වියදම රු. 44,228,143 ක් බැගින් අඩුවෙන් ද, ජංගම වත්කම් හා රාජ්‍ය ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයීම් වියදම් අඩුවෙන් තක්සේරුවී ඇති අගයට සමාන වටිනාකමක් ප්‍රදාන කපාහැරීම් ලෙස ලාභාලාභ ගිණුමට අඩුවෙන් බැරකර ඇති බැවින් ශුද්ධ අතිරික්තයට හෝ ශුද්ධ වත්කම් කෙරෙහි බලපෑමක් සිදුවී නැත. | නිවැරදි ගිණුම්කරණ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට දක්ෂිණ මණ්ඩපයේ පැවැති රු. 4,976,791 ක් වූ තොග මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබීම හේතුවෙන් ආදායම් ප්‍රකාශයේ දැක්වෙන ශුද්ධ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි ගිණුම්කරණ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඇ) | පරිගණක පිය්ය සඳහා සමාලෝචිත වර්ෂයතුළ මිලදීගෙන තිබුණු පිරිවැය රු.4,358,000 ක් වූ පරිගණක 20 ක අගය පරිගණක අළුත්වැඩියා වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, එම පරිගණකවල වාර්ෂික ක්ෂය වියදමද සැලකිල්ලට ගත් විට වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 3,813,250 ක් අඩුවෙන්ද දැක්වුණි. | අතපසුවීමකින් සිදුවී ඇති දෝෂය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | නිවැරදි ගිණුම්කරණ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඈ) | විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය ස්ථාපිතකර ඇති ඉඩමේ කැබලි අංක 1830 දරණ හෙක්ටයාර 56.6 ක් වූ ඉඩම් කොටස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.112,000,000 කට තක්සේරුකර තිබුණු නමුත් එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන | දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කර ඇති අංක 1830 දරණ ඉඩම් කොටසෙහි තක්සේරු වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2021.12.20 දින සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවා තිබුණද එය දක්ෂිණ | නිවැරදි ගිණුම්කරණ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | |
|---|---|
| වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මණ්ඩපය වෙත එවා ඇත්තේ 2022 වසරේදීය. එබැවින් 2022 වසරේදී ගිණුම්ගත කර ඇත. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ප්‍රසම්පාදන | රු. 144,758,724 | විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍ය අරමුදලින් ක්ෂේත්‍රයන් 03 කට අදාලව සිදුකර තිබුණු එකතුව රු. 144,758,724 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන්ට අදාල ලිපිගොනු විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොකෙරුණි. එමනිසා මෙකී ප්‍රසම්පාදන කාර්යයන් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය. | 2022 මාර්තු 28 දිනැතිව ඉල්ලා ඇති ප්‍රසම්පාදන වලට අදාලව පවත්වාගෙන යන ලද සියලු ලිපිගොණු විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර, ඉල්ලා ඇති අනෙක් තොරතුරු ලබාදීම සඳහා අවශ්‍ය ලිපිගොණු සම්බන්ධව වැඩිවිස්තර ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. | විගණන කාර්යයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාඨමාලා ගාස්තු කාලීනව අයකර නොතිබීම හේතුවෙන් 2021දෙසැම්බර් 31 දිනට හිඟහිට පැවති පාඨමාලා ගාස්තු ආදායම රු. 330,112,437 ක් විය. එයින් රු. 140,003,399 ක් වර්ෂ 02 ත් 04 ත් අතර කාලයක සිට හිඟ හිට පැවැති අතර රු.45,965,400 ක් වර්ෂ 04 කට වඩා කාලයක් හිඟ හිට පැවතුණි. | අධ්‍යයන වර්ෂයේ පාඨමාලා ගාස්තු සෑම වසරකම නොවැම්බර් 30 දිනට ගෙවිය යුතු බැවින් එදිනට උපචිත ආදායම හඳුනා ගැනේ. එහෙත් වසංගත තත්ත්වය හා ආර්ථික අපහසුතා හේතුවෙන් සහන කාලයන් ඉල්ලා ඇති බැවින් හිඟහිට පැවති පාඨමාලා ගාස්තු ඉදිරි වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කෙරේ. | හිඟ පාඨමාලා ගාස්තු කාලීනව අයකර ගැනීම සඳහා ක්‍රමවේද ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | විදේශීය සුදුසුකම් මත බඳවාගත් සිසුන් සඳහා විශ්ව විද්‍යාලය මගින් ආහාර සහ නේවාසිකාගාර පහසුකම් සැපයීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව අයවියයුතු ගාස්තු අදාල මාසය අවසානයේ ගෙවියයුතු වුවත්, 2021 දෙසැම්බර් 31 | හිඟමුදලින් අයකර ගත නොහැකි එක්සත් ජනපද ඩොලර් 7636 ක් කපා හැරීමට කටයුතු කරමින් පවතී. තවදුරටත් අයවියයුතු මුදලින් 65% 2022. 06.22 දිනට අයකර | විදේශ විනිමය ලෙස ලැබියයුතු මුදල් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනට ආහාර සැපැයීම වෙනුවෙන් රු.10,815,115 ක්ද නේවාසික පහසුකම් සැපැයීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 118,107 අයවියයුතුව පැවති අතර හිගව පැවති කාලය වර්ෂ 1- 04 අතර පැවතුණි. | ගෙන ඇත. ඉතිරි මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කෙරේ. මින් ඉදිරියට හිගමුදල් ඇතිනොවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ඇ) | ඇප බැදුම්කරයන්ට යටත් විශ්වවිද්‍යාල සිසුන්, කථිකාචාර්ය වරුන් සහ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයන් 76 ක් විසින් ඇප බැදුම්කර කොන්දේසි කඩකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු. 75,027,980 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. තවද, මෙම අගය තුළ ඇතුළත් රු.58,750,000 ක්වූ 2018, 2019 හා 2020 යන වර්ෂයයන්හිදී සිදුව තිබුණු ඇප බැදුම්කර කඩකිරීම් අවස්ථා 58 ක් කාලීනව හදුනාගෙන නොතිබුණි.<br>මෙම ඇප බැදුම්කර කොන්දේසි කඩකිරීම් පිළිබඳව නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇතත්, ඒ මත ඇතිකරගත් එකඟතාවයන් පරිදි අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකරගැනීම සතුටුදායක මට්ටමක නොපැවතුණි. | මෙම ණය අයකර ගැනීම සදහා විශ්ව විද්‍යාලය උපරිම වශයෙන් ප්‍රයත්නයන් දරා ඇත. නඩු පැවරීමෙන් පසු නඩු තින්දු ප්‍රකාශයට පත්වන තෙක් ණය අයකර ගැනීම පිළිබදව ආයතනයට කටයුතු කළ නොහැක. | ඇප බැදුම්කර කොන්දේසි කඩකිරීම් කාලීනව හදුනාගැනීම, ඒ සම්බන්ධ පාලන පිළිවෙත් හදුන්වාදීම හා ගෙවීම් පැහැරහැරීම් සදහා කඩිනම් නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුයි. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් කාර්යන් 48 කට අදාල රු. 14,660,162 ක කොන්ත්‍රාත් රැදවුම් මුදලක් පැවති අතර වර්ෂ 04 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. | රදවාගැනීමේ මුදල් ව්‍යාපෘති භාර නිළධාරියාගේ සහතිකය හා සේවා සැපැයුම්කරුගේ ලිඛිත ඉල්ලීම මත නිදහස් කරනු ලැබේ. ඒ අනුව හිමිකම් ඉල්ලා නොමැති හා ව්‍යාපෘතිය නිම වී වසර දෙකකට වඩා පැරණි රදවාගත් මුදල් ඉදිරියේදී ආදායම් ලෙස හදුනාගැනීම කටයුතු කෙරේ. | එක් එක් කොන්ත්‍රාත්තුවට අදාල රැදවුම් මුදල් පිළිබඳ යාවත්කාලීන තොරතුරු පවත්වාගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ 1 වන අනු ව්‍යවස්ථාව. | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පලාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් විගණකාධිපති වරයා විසින් විගණනය කළයුතු වුවද විශ්වවිද්‍යාලය වෙත පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිත සමාගමක 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් විගණනය පෞද්ගලික විගණන සමාගමක් වෙත පවරා තිබුණි. | වාර්ෂික විගණන පරීක්ෂාවලදී ඉල්ලා සිටින ලද සියලු තොරතුරු ලබාදී ඇති අතර සමාගමේ කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට බාධාවක් නොමැති බව පෙන්වා දෙමි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් ආයෝජනය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කල එක්සත් ජනපද ඩොලර් 22,026,833 ක් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනතේ 4(ඊ) වගන්තියේ සඳහන් බලතල ප්‍රකාරව කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත කෙටිකාලීන ආයෝජන සිදුකර ඇත. | 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(5) | දෙන ලද අත්තිකාරම් මුදල් පියවීම අදාල මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවද 2013, 2015 සහ 2021 වර්ෂවලදී විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.13,690,732 ක අත්තිකාරම් | නිරවුල් කිරීමට කටයුතු කෙරේ. | අත්තිකාරම් මුදල් පියවීම අදාල මුදල් රෙගුලාසි 371(5) ට අනුකූලව සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (ඈ) | මුදල් රෙගුලාසි 570 | රෙගුලාසිය ප්‍රකාරව ව්‍යාපෘති අරමුදල් තැන්පතු එම ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වර්ෂ 2 ක් තුල හිමිකම් නොපෑවොත් ඒවා ඉකුත්වූ ලෙස සලකා කටයුතුකල යුතු වුවද විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීමට අදාලව රදවාගෙන තිබුණු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු. 42,169,291 ක් වූ අතර එම ව්‍යාපෘතිය අවසන්කර වර්ෂ 04 කට අධික කාලයක් ගතවී ඇතත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ආදායමට ගැනීමට කටයුතුකර නොතිබුණි . | රෝහල් ව්‍යාපෘතියේ සම්පූර්ණ නොකළ ඉදිකිරීම් හා පවත්නා අඩුපාඩු සඳහා මෙම මුදල රදවාගෙන ඇත. සම්පූර්ණ නොකළ ඉදිකිරීම් හා අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව නිරවුල් කෙරේ. | වර්ෂ 2 ක් තුල හිමිකම් නොපෑවොත් ඒවා ඉකුත්වූ ලෙස සලකා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකල යුතුය. |
| (ඉ) | මුදල් රෙගුලාසි 71 | මුදල් රෙගුලාසිය ප්‍රකාරව තනතුර ඇතිකිරීම සඳහා කලමනානරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද කලමනාකරණ මණ්ඩල තීරණයක් මගින් මෙට්‍රෝපොලිටන් කැම්පස් ඇපයෙන් සීමිත සමාගමේ මණ්ඩපාධිපති නමින් නව තනතුරක් ඇතිකර 2021.10.01 දින සිට 2022.02.21 දක්වා වැටුප් ගෙවා තිබුණි. | තනතුරු ඇති කිරීම සඳහා මුදල් රෙගුලාසි 71 අයදුම්පත් කලමනානරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකිරීම සඳහා 2022.05.26 දින ආරක්ෂක අමාත්‍යාංශයට යොමුකර ඇත. මණ්ඩපාධිපති තනතුර සඳහා අදාල පත්කිරීම සිදුකිරීමට 2021.07.12 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණි. ගෙවනුලබන දීමනා සම්බන්ධව 2022.02.21 දින පැවැති 640 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත්කල පත්‍රිකාව අනුමත නොකරන ලදි. | තනතුර ඇතිකිරීම සඳහා කලමනානරණ සේවා දෙපාර්තමේන්තු වේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත බඳවාගැනීම හා වැටුප් ගෙවීම සිදුකළ හැක. |
| (ඊ) | 1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල | පූර්වෝක්ත පනතේ දැක්වෙන විශ්ව විද්‍යාලය පිහිටුවීමේ පරමාර්ථ අනුව කැඩෙට් නිළධරයන්, නිලධරයන් සහ රජයේ නිලධරයන් සඳහා රාජ්‍ය ආරක්ෂාව සහ යුධ හමුදා කළමනාකරණය සඳහා | රජයේ විශ්වවිද්‍යාලයක් ලෙස ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ඒ ඒ වර්ෂයට අදාල පුරප්පාඩු මත පදනම්ව විවිධ උපාධි පාඨමාලා සඳහා ගැසට්කර ප්‍රථමයෙන් කැඩෙට් නිළධාරීන් බඳවාගනු ලබන | 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තිරණ පරිදි පනත සංශෝධන කාර්යය කඩිනම් |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත. | අදාල වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ උපදෙස් සැපයීම වුවද 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශීය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණු අතර 2021 අධ්‍යයන වර්ෂය සඳහා එවැනි සිසුන් 826 ක් සඳහා උපාධි පාඨමාලා 27 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | අතර ඉන් පසු එකිනෙක උපාධි පාඨමාලාවේ තවදුරටත් උපරිම ධාරිතාවය තුල පුරප්පාඩු පවතීනම් පමණක් ඒ සඳහා වෙන වෙනම පුවත්පත් දැන්වීමක් පලකර ඒ සඳහා මුදල් ගෙවීමේ පදනම මත විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ සිසුන් බඳවාගෙන ඉහත හිඩසෙහි තව කොටසක් රජයේ විශ්ව විද්‍යාලයක් ලෙස පුරවනු ලබයි. කැඩෙට් නිළධාරීන්ට අමතරව මුදල් ගෙවීමේ පදනම මත සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා පවතින පනතේ ප්‍රතිපාදනයන්හි යම් ව්‍යාකූලතා /අපැහැදිලිතාවයක් පැවැති බැවින් ඒවා වඩාත් පැහැදිලි ලෙස දක්වමින් නව පනත් කෙටුම්පතක් පවත්නා පනත පරිච්චින්න කොට ගෙන ඒමට කටයුතු කර ඇත. | කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 95,630,017ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 538,182,868ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 633,812,885ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා රෝහල් ආදායම වර්ධනය වීම, පොලී ආදායම වර්ධනය වීම සහ විවිධ ආදායම් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) 2020 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු ආදායම සියයට 21 ක වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතාවන් පහත පරිදි විය.

| ආදායම | 2021 වර්ෂය | 2020 වර්ෂය | වැඩිවීම | උපනතිය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| මුළු ආදායම | 10,746,884,747 | 8,915,954,450 | 1,830,930,297 | 21 |
| රෝහල් අදායම් | 472,359,607 | 130,852,639 | 341,506,968 | 261 |
| පොලී ආදායම | 726,274,095 | 286,414,511 | 439,859,584 | 154 |
| වෙනත් ආදායම් | 1,063,448,746 | 164,847,004 | 898,601,742 | 545 |

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. මිලියන 6,155.87ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම වියදම සියයට 36 කින් හෙවත් රු. මිලියන 1,628 කින් වර්ධනය වී පැවතුණි. මෙම වර්ධනය සඳහා පුද්ගල පඩිනඩි හා රෝහල් වියදම් යන වැය කාණ්ඩයන්හි සිදුවූ වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ප්‍රධාන වැය විෂයයන්වල ප්‍රවණතාවන් පහත පරිදි විය.

| වියදම | 2021 වර්ෂය | 2020 වර්ෂය | වැඩිවීම | උපනතිය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| මුළු වියදම | 10,651,254,730 | 9,454,137,318 | 1,197,117,412 | 13 |
| මූල්‍ය වියදම | 4,495,383,107 | 4,926,281,163 | -430,898,056 | -9 |
| පුද්ගල පඩිනඩි | 2,438,589,805 | 1,956,933,614 | 481,656,191 | 25 |
| වෙනත් වර්තන වියදම් | 368,251,488 | 287,610,438 | 80,641,050 | 28 |
| රෝහල් වියදම් | 941,862,265 | 72,288,867 | 869,573,398 | 1203 |
| නඩත්තු | 201,716,909 | 176,207,972 | 25,508,937 | 14 |
| ක්ෂය වියදම් | 1,442,180,785 | 1,288,130,870 | 154,049,915 | 12 |

(ඇ) තවද, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ සමස්ථ වියදමින් සියයට 39.6ක් හෙවත් රු. මිලියන 2,438.5ක් පුද්ගල පඩිනඩි වෙනුවෙන් දරා තිබුණු අතර එය විශ්ව විද්‍යාලයේ මුළු ආදායමින් සියයට 22.6ක් වී තිබුණි.

(ඈ) විශ්ව විද්‍යාලයේ සමස්ථ වියදමෙන් සියයට 42 ක් හෙවත් රු. මිලියන 4,495 ක් ණය පිරිවැය වෙනුවෙන් දරා තිබුණු අතර එය විශ්ව විද්‍යාලයේ මුළු ආදායමින් සියයට 43 ක් වී තිබුණි. මෙම ණය පිරිවැය විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීම හා උපකරණ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකර මත ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබූ එක්සත් ජනපද ඩොලර් මිලියන 201.629 ක ණය මුදල හේතුවෙන් ඇති වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) 2020 වර්ෂයේදී සෘණ 5.86ක්ව පැවති ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී ධන 1.09 දක්වා වර්ධනය වී පැවතුණි.

(ආ) 2020 වර්ෂයේදී 1.5:1 ක්ව පැවති ජංගම වත්කම් වලට ජංගම වගකීම් අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 3.2:1 ක් දක්වා වර්ධනය වී පැවතුණි.

(ඇ) 2020 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය මත ණය ප්‍රාග්ධන අනුපාතය 4.47:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම අධි තෝලන තත්ත්වය තවදුරටත්නොවෙනස්ව පැවතුනි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කර වර්ෂ 07 ක කාලයක් ගතවී ඇතත් මණ්ඩපය වෙත පවරාදී තිබුණු කැබැලි අංක 1832 දරණ හෙක්ටයාර 5.1363 ක් වූ බිම් කොටසේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර හෙක්ටයාර් 7.6883 ක් වූ ඉඩම් පවරාගැනීමේ කාර්යයන්ද අවසන්කර නොතිබුණි. | කැබැලි අංක 1832 දරණ ඉඩම් කොටස කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය වෙත පවරා දීමෙන් පසුව බදුල්ල තක්සේරු අංශය විසින් තක්සේරු කටයුතු කිරීමට ඉදිරි පියවර ගෙන තිබේ. හෙක්ටයාර් 7.6883 ක් පමණ වන ඉඩමෙහි පවරා ගැනීමේ අවසන් කටයුතු සිදුකරමින් පවතී. | වත්කම් වල නිත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුයි. |
| (ආ) | විශ්ව විද්‍යාලයීය ශික්ෂණ රෝහල ස්ථාපිත කර ඇති හෙක්ටයාර් 21.5815 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විශ්ව විද්‍යාලය වෙත පැවරී නොතිබුණි. එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලි වල වටිනාකම රු.මිලියන 31,101 ක් වූ අතර භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 1,216 ක පිරිවැයක්ද දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 05 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කාර්යයන් අවසන් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන වලින් මෙම ඉඩමේ වටිනාකම නිරූපණය කර නොතිබුණි. | විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල ස්ථාපිත කර ඇති කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේරහැර පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම් කොටස පවරා ගැනීමේ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය මගින් සිදු කරමින් පවතී. | වත්කම් වල නිත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුයි. |

**3.2** නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශික්ෂණ රෝහලේ විකිරණ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ වෛද්‍ය නිලධාරී හා විකිරණ ශිල්පී තනතුරු ඇතුළු තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පියයුරු පිළිකා හඳුනා ගැනීමේ ඒකකය (Breast Health Centre) සහ න්‍යෂ්ඨික විකිරණ වෛද්‍ය ප්‍රතිකාර ඒකකය (Nuclear Medicine) යන අංශ ප්‍රතිකාර සේවා සඳහා ආරම්භ කර නොතිබුණි. එබැවින් ඒ සඳහා වෙන්කර ඇති පරිශ්‍රයන්ද, මිලදීගෙන තිබුණු ගෘහ භාණ්ඩ හා වෛද්‍ය උපකරණද ඵලදායී ලෙස උපයෝජනයට නොහැකිව තිබුණි. | පියයුරු පිළිකා හඳුනාගැනීමේ ඒකකය (Breast Health Centre) පිහිටුවීම සඳහා අවශ්‍යවන Mammogram යන්ත්‍රය ස්ථාපනය කිරීමට විකිරණ අංශය තුල ස්ථානයක් වෙන්කර තිබුනද විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රමාණය නොමැතිවීම නිසා මෙම ඒකකය ආරම්භ කිරීමට මෙතෙක් කටයුතුකර නොමැත. වර්තමානයේ රෝහල තුල විකිරණවේදී විශේෂඥ වෛද්‍යවරුන් එක් අයකු පමණක් සේවය කරන අතර රෝහලේ අනෙකුත් විකිරණවේදී අවශ්‍යතා සියල්ලම ඉතා අපහසුවෙන් සම්පූර්ණ කරනු ලබයි. එබැවින් විකිරණවේදී විශේෂඥ වෛද්‍යවරයකු යටතේ ක්‍රියාත්මක විය යුතු නව ඒකකය ආරම්භ කිරීමට නොහැකිවී ඇත. | ඵලදායී ලෙස උපයෝජනයට කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රධාන වාට්ටු 03 ක් හා සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය හා පවුල් සායන ඒකක ඇතුළු අංශ කීපයක මෙහෙයුම් කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක නොවෙමින් පවත්නා බව විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව සමඟ 2017 අග භාගය වන විටත් අවශ්‍ය කාර්ය මණ්ඩල තනතුරු සකසමින් පැවැතුනි. ඉන් අනතුරුව එක් එක් තනතුරුවලට අදාල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීම් සිදුකරගැනීමට අනුමැතිය දීමෙන් අනතුරුව බාහිර රෝගී අංශය 2017.12.15 විවෘත කරන ලදි. | රෝහලේ ප්‍රසස්ථ ක්‍රියාකාරිත්වය කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | චුම්බක අනුනාද ප්‍රතිරූපන ස්කෑනර් යන්ත්‍රය (MRI Scanner) 2017 දෙසැම්බර් 28 දින ස්ථාපිත කර ඇතත් භාවිතා කිරීම මාස 21 ක කාලපමාවකින් පසු 2019 ඔක්තෝබර් 16 දින ආරම්භකර තිබුණි. එදින සිට 2021 ඔක්තෝබර් මස දක්වා කාලය තුළ යන්ත්‍රයේ සාමාන්‍ය මාසික භාවිතය පරීක්ෂණ 21 ත් 52 ත් වැනි පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.<br>එසේම, CT Scanner යන්ත්‍රය( SLICE Computed Tomography) 2018 ජනවාරි 31 දින ස්ථාපිත කර ඇතත් භාවිතා කිරීම 2018 ජුනි 13 දින ආරම්භ කර තිබුණු අතර සාමාන්‍ය මාසික උපයෝජනය පරීක්ෂණ 22 ත් 192 ත් අතර පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම මෙම යන්ත්‍ර ප්‍රසස්ථ ලෙස උපයෝජනය කෙරේ අහිතකරව බලපා තිබුණි. | විකිරණ දෙපාර්තමේනුතුවේ විකිරණ ශිල්පී(රෝග විනිශ්චය) - විශේෂ ශ්‍රේණිය, විකිරණ ශිල්පී (චිකිත්සක) විශේෂ ශ්‍රේණිය, සහ විකිරණ ශිල්පී (චිකිත්සක) තනතුරු සඳහා කාර්යමණ්ඩලය බඳවාගැනීමට අපහසුවී ඇත. නමුදු මේ වන විට විශ්ව විද්‍යාලීය රෝහල මුළු ධාරිතාවයෙන් 50% ක පමණ ප්‍රමාණයකින් ක්‍රියාත්මක වන අතර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන පීඨයේ ගිවිසුම්ගත විකිරණ ශිල්පීන් 21 දෙනෙකු සහ බාහිරව බඳවා ගන්නා ලද එක් අයෙකු සේවයේ නිරතවන බැවින් විකිරණ දෙපාර්තමේන්තුව මගින් මහජනතාව වෙත ප්‍රසස්ථ සේවාවක් සැපයීමට කටයුතු කරන බැව් වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ. | උපකරණ ප්‍රසස්ථ ලෙස උපයෝජනය සඳහා කටයුතු කල යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 අනුව හා ලංසු ලේඛණවල සඳහන් පරිදි ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවත් සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු සුරක්ෂණයන්හි වටිනාකම ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2 ට අඩු අගයක් බව නිරීක්ෂණය විය. | මෙම මිලදී ගැනීම සිසුන් ගේ කැමැත්ත මත සිදුවන්නක් බැවින් මිලදීගන්නා සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කල නොහැකිවිය. එබැවින් ආසන්න වශයෙන් අවශ්‍යතාවය සඳහන් කොට කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම තීරණය කරනලදී. | ප්‍රමාණවත් කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සැපයුම්කරු තෝරාගැනීමෙන් පසු පිරිවිතර වෙනස්කිරීම නිසා i3 පරිගණක සඳහා මිලගණන් ඉදිරිපත් කල හැකිව තිබුණු විභව ලංසුකරුවන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණු අතර ඒ හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) | සැපයුම්කරු ඉදිරිපත්කල i3 පිරිවිතරයන් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගන්නා ලදී. එහිදී i5, i3ලෙස සංශෝධනය වුවද අනෙකුත් අත්‍යවශ්‍ය පිරිවිතරයන්ගේ වෙනසක් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථාව ලබාදීම යන අරමුණ ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය. | නොමැති බවත් පවත්නා වෙළඳපල තත්වයන් අනුව මිලගණන් සාධාරණ බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර ඇත. | සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීමට වගබලා ගත යුතුයි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වූ අතිරේක 35 අනුව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරනු ලබන අවස්ථාවකදී අවම වශයෙන් ලංසු කරුවන් තිදෙනෙකුවත් ඇගයීම සඳහා යොදාගත හැකි වන පරිදි ලංසු කැඳවිය යුතු වුවද මෙට්‍රෝපොලිටන් කැම්පස් ඇපයෙන් සීමිත සමාගමේ මණ්ඩපාධිපති සඳහා කුලී පදනම මත රථයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකු පමණක් ඉදිරිපත්කළ ලංසු සලකාබලා තිබුණි. තවද අමාත්‍යාංශ ලියාපදිංචි සැපැයුම්කරුවන් 61 ක ගෙන් විද්‍යුත් තැපැල මගින් ලංසු කැඳවා ඇති බවට වාර්තාගතව ඇතත් ලංසු ලේඛණ එම සැපැයුම්කරුවන්ට ලැබුනේද යන්න තහවුරු නොවුනි. එසේම තෝරාගත් සැපයුම්කරු අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවන බව නිරීක්ෂණය විය. | මෙකී ප්‍රසම්පාදන කාර්යයයේ තරඟකාරිත්වය වැඩිකිරීම සඳහා මිල කැඳවුම් පත විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවෙහිද පළකරන ලදී. සැපැයුම්කරුවන් දෙදනෙකු පමණක් ලංසු ඉදිරිපත්කර තිබුණු අතර අවම ලංසුව තෝරාගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වූ අතිරේක 35 අනුව කටයුතු කළ යුතුය. |